සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

11 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව I

කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 පෘථිවියේ මුළු භූමියෙන් 7% ක පමණ ප්‍රදේශයක පැතිර ඇත්තේ............................................ වනාන්තර වර්ගයයි. (නිවර්තන වර්ෂා , පතනශීලි , කේතුධර )

02 අප්‍රිකාවේ නයිල් ගංගාව ..................................................................................විලෙන් ආරම්භ වේ. (බයිකල් / එරල් / වික්ටෝරියා)

03 පෘථිවි කබොල ආසන්නයේ අභ්‍යන්තරයේ මැග්මා සිසිල් වීමේ ............................................ පාෂාණ නිර්මාණය වේ. (නිෂ්ක්‍රාන්ත / ආග්නේය/ ආක්‍රාන්ත / විපරිත )

04 නියත රසායනික සංයුතියක් ඇති ස්වාභාවික අනෛන්ද්‍රිය ද්‍රව්‍ය ................................... ලෙස හඳුන්වයි. (පාෂාණ / පස / ඛණිජ )

05 බ්‍රසීලියානු සාගරික ප්‍රවාහය .....................ප්‍රවාහ ගණයට අයති වේ. (ශීත / උණුසුම් /ධ්‍රැවීය)

06 රුමස්සල, ත්‍රිකුණාමලය යත ප්‍රදේශවල වෙරලාශ්‍රිත................................. බහුලව දැකිය හැකිය. (වැලි / ඩෙල්ටා / දඹ )

07 ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ ප්‍රදේශයේ .........................................පාෂාණ දක්නට ඇත. (උස්බිම් ශ්‍රේණියේ / විජයානු ශ්‍රේණියේ / පුරාසික )

08 පිදුරුතලාගල කඳුවලට බටහිරින් .................................................................සානුව පිහිටා තිබේ. (හැටන් / වැලිමඩ /මහනුවර )

09 වසර 2050 වන විට ලොව ජන සංඛ්‍යාව අතින් ප්‍රමුඛවන්නේ ...................................... වේ. (චීනය / ඇමෙරිකා එක්සත් ජනපදය / ඉන්දියාව )

10 කල්කටාව , මුම්බායි, හොංකොං වැනි රටවල් ............................ නිසා වර්ධනය වූ නගර වේ. (වරාය / වෙළඳාම / පරිවහනය )

- **අංක 11 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

11 දළ උපත් අනුපාතිකය රටක ගණනය කරනු ලබන්නේ

(1) ජන සංඛ්‍යාවෙන් 100 කට ඇති සජීවී උපත් ප්‍රමාණය මගිනි.

(2) ජන සංඛ්‍යාවෙන් 1000 කට ඇති සජීවී උපත් ප්‍රමාණය මගිනි.

(3) ජන සංඛ්‍යාවෙන් 10000 කට ඇති සජීවී උපත් ප්‍රමාණය මගිනි.

(4) රටේ සියලුම උපත් වර්ග ප්‍රමාණයෙන් බෙදීමෙනි.

12 ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3000 ට වඩා වැඩි වර්ෂාවක් ලබන දේශගුණික කලාපය මින් කුමක්ද?

(1) අර්ධ ශුෂ්ක කලාපය (2) පහත රට තෙත් කලාපය

(3) පහතරට වියලි කලාපය (4) කඳුරට තෙත් කලාපය

13 ශාක සම්පත් සංරක්ෂණය උපාය මාර්ග පමණක් අඩංගු වන පිළිතුර මේවායින් තෝරන්න.

(1) නැවත වන වගාව හා අනවසර දැව කැපීම.

(2) සතුන් දඩයම හා දැව පරිහරණයේදී සිදුවන නාස්තිය වළක්වා ගැනීම.

(3) කෘමි උවදුරු වැළැක්වීම හා නීති රීති නිසිපරිදි ක්‍රියාත්මක කිරීම.

(4) නිවාස ඉදිකිරීම සහ සංවර්ධන ව්‍යාපාර ඇති කිරීම.

14 පහත දැක්වෙන වගාවට යෝග්‍ය වන සාධක අතුරින් තිරිඟු වගාවට යෝග්‍ය වන සාධක පමණක් අඩංගු වන්නේ කුමන පිළිතුරේද?

(1) $13\,^{\circ}C - 21\,^{\circ}C$ අතර වර්ෂාපතනය , චර්නොසම් පස.

(2) වෙළඳපොල , 1275 mm හා 875 mm අතර වර්ෂාව

(3) උසස් වර්ගයේ බීජ භාවිතය , $23^{\circ}C - 30^{\circ}C$ අතර වර්ෂාව

(4) වියළි කාලගුණය , ජල වහනය සහිත රැළි බිම.

15 ඝානාව, නයිජීරියාව, වෙනිසියුලාව, ඉක්වදෝරය යන රටවල් වැදගත් වන්නේ මින් කුමන භෝග වර්ගයක් වැවීම සඳහා ද?

(1) තේ (2) පොල් (3) කෝපි (4) කොකෝවා

16 මේවායින් සිලිකා වැලි නිධි පවතින ප්‍රදේශ පමණක් අඩංගු වන පිළිතුර තෝරන්න.

(1) කයිකාවල , බේරුවල (2) රත්තොට, පිළියන්දල

(3) මාරවිල , නාත්තන්ඩිය (4) මුලතිව් , මාරවිල

17 පහත දැක්වෙන ආදී වාසීන් හා ඔවුන් ජීවත්වන රට නිවැරදිව දැක්වෙන්නේ කුමන පිළිතුරෙහිද?

(1) ඕස්ට්‍රේලියාව ඔමරිවරු (2) බ්‍රසීලය ටුවරෙග්වරු

(3) නවසීලන්තය ඇබෝර්ජින්වරු (4) දකුණු අප්‍රිකාව බෙඩුවින්වරු

18 ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකක් වන්නේ මින් කවරක්ද?

(1) උපත් හා සංක්‍රමණ (2) ආගමන හා විගමන

(3) උපත් හා මරණ (4) ශුද්ධ සංක්‍රමණ හා මරණ

19 ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය අනුව පිළිවෙලින් දිස්ත්‍රික්ක අඩංගු වන්නේ මින් කවර පිළිතුරේ ද?

(1) කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, ගාල්ල

(2) කොළඹ, කළුතර, මහනුවර, ගාල්ල, මාතර

(3) යාපනය, කොළඹ, ගාල්ල, මහනුවර, මාතර

(4) යාපනය, කොළඹ, කළුතර, ගම්පහ, මහනුවර

20 සම්පත් පරිහරණයේදී ප්‍රාථමික ආර්ථික කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබන ජනාවාස වර්ගය මින් කුමක්ද?

(1) නාගරික ජනාවාස (2) ග්‍රාමීය ජනාවාස

(3) ගැමිරික ජනාවාස (4) නගර යාය

The National e-Learning Portal for The General Education

- **අංක 21 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

21 වායුගෝලීය ස්තර අනුව පරිවර්තී ගෝලය ........................................................ ප්‍රදේශවලදී කිලෝමීටර් 8 ක් පමණ ඉහලට දක්නට ඇත.

22 ගොඩබිමින් සම්පූර්ණයෙන්ම වට වූ මිරිදිය පිරුණු ජලාශ ...................................... ලෙස හඳුන්වයි.

23 විශාලත්වයෙන් තෙවැනි තැන ගන්නේ ..................................................................මහාද්වීපය වේ.

24 ඉන්දියානු භූ තැටිය උතුරට පාවී ගොස් .......................................................................... තැටිය සමඟ ගැටීමෙන් ................................ කඳු නිර්මාණය වී තිබේ.

25 එඩ්නා ගිනිකන්ද පිහිටා තිබෙන්නේ .......................................................................... ද්වීපතේ ය.

26 ඕක්, මේපල්, බීච් වැනි ශාක වැවෙන්නේ .......................................................................... වනාන්තරවල වේ.

27 ඕස්ට්‍රේලියාවේ බහුලව පවතින්නේ ........................................................................................ දේශගුණයට අයිති ප්‍රදේශ වේ.

28 සංවර්ධිත රටවල් වෙළඳ ශේෂය .................................................................... කර ගැනීමට සැපයුම සීමා කිරීම, මිල තීරණයට බලපෑම් කිරීම වැනි උපක්‍රම අනුගමනය කරනු ලැබේ.

29 භාණ්ඩ හුවමාරුවන නැව් මාර්ග අතරින් ................................................................... මාර්ගය යුරෝපා රටවල් ආසියාව හා ඕස්ට්‍රේලියාව සමඟ සම්බන්ධ කරයි.

30 ජාත්‍යන්තර සංක්‍රමණ නිසා සිදුවන ............................................................... හේතුවෙන් ඇතැම් රටවලට පුහුණු ශ්‍රමිකයන් අහිමිවීම ගැටළුවක් වී තිබේ.

- **අංක 31 සිට 40 දක්වා වූ ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (x) ලකුණද යොදන්න.**

31 උතුරු අක්ෂාංශ $10^{\circ}$ ත් $40^{\circ}$ අතර උතුරු අර්ධ ගෝලයේ ජන සංඛ්‍යාවෙන් 50% ක් පමණ ජීවත් වේ. ( )

32 යම් ප්‍රදේශයක සිදුවන පරිසර දූෂණය සංක්‍රමණ ආශ්‍රිත නිෂ්කර්ෂණ සාධකයකි. ( )

33 ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ බහුලව ඇත්තේ රතු දුඹුරු පස වේ. ( )

34 ගල් ඔය ආශ්‍රිතව පවතින ජලාශයක් ලෙස සේනානායක සමුද්‍රය දැක්විය හැකි ය. ( )

35 ඊයම් හා සින්ක් ඛණිජ බහුලව චීනයේ දක්නට ඇත. ( )

36 බෝර්කියෝ හා ඒ අවට දූපත්වල පතනශීලි වනාන්තර පිහිටා ඇත. ( )

37 ජපන් වාහනවලට ඇති ඉල්ලුම අඩුවීම මෝටර් රථ කර්මාන්තය ආශ්‍රිත ප්‍රවණතාවයකි. ( )

38 ලෝකයේ තැටි කිඳා බසින කලාපය ආශ්‍රිතව යමහල් සිදුවනු දැකිය හැකි ය. ( )

39 ගැමිරික ජනාවාස ප්‍රදේශයක බෙහෙවින් සිදුවන්නේ නාගරික ප්‍රදේශයට ජනයා ඇදී යාමකි. ( )

40 ශ්‍රී ලංකාවේ A හා B කාණ්ඩවලට අයත් මාර්ගවල අයිතිය හා නඩත්තුව පළාත් සභාවලට ඇත. ( )

(ලකුණු 40 යි.)

The National e-learning Portal for The General Education

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **I** කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. **II** කොටසින් ප්‍රශ්න 2 කටත්, **III** කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු දිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න 5 කි.

## I කොටස

01 (අ) සපයා ඇති මෙට්‍රික් සිතියම භාවිතා කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) සිතියමේ X සිට Y දක්වා ප්‍රධාන මාර්ගයේ දිග විය හැක්කේ කිලෝමීටර් ( 4.5 / 9.0 /18)

(2) D වලින් දැක්වෙන ත්‍රිකෝණමිතික ස්ථානයේ අගය විය හැක්කේ (මීටර් 320 / මීටර් 382 / මීටර් 302)

(3) E සිට F දක්වා ගංගාවට නැගෙනහිරින් පවතින මායිම කුමක්ද?

(4) A සිට B දක්වා දැක්වෙන භූ ලක්ෂණය මින් කවරක්ද? (නිම්න / නෙරුව /සානුව)

(5) H වලින් දැක්වෙන ස්ථානයේ දේශාංශක අගය කුමක්ද?

(6) මෙම භූමි කොටසේ පවතින වගාවන් තුනක් දක්වන්න.

(7) සිතියම් ප්‍රදේශයේ හරි මැදින් හරස්කඩක් නිර්මාණය කළහොත් බහුලව දක්නට ලැබෙන්නේ (කඳු වැටි / සානු වේ / තැනිතලා) වේ.

(8) මෙහි පවතින ජනාවාස බොහොමයක් (වතු ජනාවාස / රේඛීය ජනාවාස / වැව් ජනාවාස) වේ.

(ආ) ඔබට සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(1) දකුණු ඇමෙරිකාවේ නිවර්තන වර්ෂා වනාන්තරය

(2) උතුරු ඇමෙරිකාවේ විශාලම සෞම්‍ය කලාපික තෘණ බිම.

(3) ලෝකයේ විශාලම රන් නිධිය පිහිටි රට

(4) අත්ලන්තික් හා පැසිපික් සාගර සම්බන්ධ කරන ඇළ මාර්ගය

(5) ලෝකයේ ජල ගැලීම් බහුලව සිදුවන ආසියාතික රට (ලකුණු 05)

(ඇ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(1) දකුණු හා ගිණිකොන අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටි ජන සංඛ්‍යාව වැඩිම නගරය.

(2) වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර පිහිටි වයඹ දිශාවේ පිහිටි ප්‍රදේශය

(3) A9 මාර්ගයට සම්බන්ධවන යාපනය කලපුවට දකුණින් පිහිටි ප්‍රධාන නගරය

(4) තෙත් කලාපයේ බහුලව ගංවතුර උපද්‍රවයට ලක්වන ගංගාව

(5) මැග්නටයිට් යපස් නිධිය පිහිටි ස්ථානය

## II කොටස





02 දේශගුණය, පස හා මානව ක්‍රියාවලි අනුව වෘක්ෂලතා කලාප තීරණය වේ. ලෝකයේ ස්වාභාවික වෘක්ෂලතා ඉතිරිව ඇත්තේ ප්‍රදේශ කීපයක පමණි.

(1) නිවර්තන වනාන්තර හා පතනශීල වනාන්තර ව්‍යාප්තව ඇති ප්‍රදේශ 2 බැගින් මෙම ලෝක සිතියෙම් දක්නට ඇත. ඒවා වෙන වෙනම නම් කරන්න.

(2) කේතුධර වනාන්තර පවතින ප්‍රදේශවල එම ශාක ආශ්‍රිත විශේෂ ලක්ෂණ 2ක් සඳහන් කරන්න.

(3) කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයට අනුව නිවර්තන දේශගුණ වර්ග තුන දක්වා ඉන් එක් දේශගුණ වර්ගයක ලක්ෂණ පැහැදිලි කරන්න.




03 කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල යකඩ හා වානේ කර්මාන්තය ආරම්භ වූ අතර පසුව කාර්මික ශක්තිය තීරණය කරන සාධකයක් ලෙස එම ප්‍රචලිත විය.

(1) සපයා ඇති ජපානයේ සිතියමේ දැක්වෙන යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන පහත සඳහන් ස්ථානවලට අදාළව අක්ෂර යොදා සඳහන් කරන්න.

නාගසාකි, කියෝතෝ, ටෝකියෝ , ඔසාකා

(2) ලෝකයේ රටවල යකඩ හා වානේ කර්මාන්තය ස්ථාන ගතවීමට බලපාන සාධක 2ක් දක්වන්න.

(3) (a) මෝටර් රථ කර්මාන්තයේ ප්‍රවණතා 2ක් සඳහන් කරන්න.

(b) අනෙකුත් කර්මාන්තවලට වඩා විද්‍යුත් කර්මාන්තයට ආවේනික වූ විශේෂතා දක්නට ඇත. ඒවායින් 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

04 ශිලා ගෝලය සෑදී ඇත්තේ පොළෝතලය මත සුලභව දක්නට ඇති පාෂාණවලිනි.

(1) පාෂාණවල උපත අනුව පාෂාණ වර්ග කර දක්වන්න.

(2) පාෂාණ නිර්මාණය වීමේ ක්‍රියාවලිය සරල සටහනක් ඇසුරින් විස්තර කර දක්වන්න.

(3) (a) ලෝකයේ ඛණිජ තෙල් හා ගල් අඟුරු ලබාගන්නා ප්‍රදේශ එක බැගින් දක්වන්න.

(b) ඛණිජ සම්පත් සංරක්ෂණය වර්තමානයේ දැඩි අවශ්‍යතාවයක් බවට පත්වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න.

05 වර්තමාන ලෝකය එකම විශ්ව ගම්මානයක් ලෙස සැලකිය හැකි තරමට අද අන්තර් මානුෂ සම්බන්ධතාවයන් වර්ධනය වී තිබේ.

(1) ලෝක වෙළඳාම රටවල් අතර බෙදීයාම අනුව බිහි වී තිබෙන විශේෂ ලක්ෂණ 2ක් දක්වන්න.


(2) (a) භාණ්ඩ හුවමාරුවන ධාරිතාවය අනුව ලොව ප්‍රධාන නැව් මාර්ග 2ක් දක්වන්න.

(b) වියදම් අධික වුවද කඩිනම් ප්‍රවාහන සේවයක් ලෙස ගුවන් පරිවහනයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පහදන්න.

(3) (a) රටක අභ්‍යන්තර වෙළඳාම කෙරෙහි බලපාන සාධක 2ක් දක්වන්න.

(b) විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයන් 2ක් දක්වා එහි අයහපත් ප්‍රතිඵල 2ක් කෙටියෙන්

පහදන්න.




### III කොටස

06 ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික රටක් වුවද 1950 න් පසුව කර්මාන්ත ක්ෂේත්‍රයෙහි වැඩි අවධානයක් යොමුකර ඇති අතර 1977 න් පසුව පෞද්ගලික අංශය කර්මාන්ත කෙරෙහි ප්‍රමුඛ වීම කැපී පෙනේ.

(1) (a) සිතියමේ දැක්වෙන A, B හා C වල පිහිටා ඇති කාර්මික ජනපද

(b) D වලින් දක්වා ඇති සීනි කම්හල ද, E වලින් දක්වා ඇති පිඟන් කම්හලද වරහන් තුළ දක්වා ඇති ස්ථානවලින් නම් කරන්න.

(රත්තොට, හිඟුරාන, බුත්තල, ඇඹිලිපිටිය, ලුණුවිල , බෙලිඅත්ත, මහනුවර, මහියංගනය අච්චුවේලි)

(2) ශ්‍රී ලංකාවේ කර්මාන්ත දියුණු කිරීමේ අවශ්‍යතාවය වර්තමානයේ වඩාත් ඉස්මතු වී ඇත්තේ ඇයිදැයි කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(3) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටළු 2 ක් දක්වා, ඊට හිතකර භූගෝලීය සාධක ඇසුරින් එය දියුණු කිරීමේ අවශ්‍යතාවය පහදන්න.


07 යැපුම් කෘෂිකර්මය හා වාණිජ කෘෂිකර්මය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයෙහි කැපී පෙනෙන අංශ දෙකකි.

(1) යැපුම් කෘෂිකර්මය යටතේ වගාකරන එක් භෝගයක් ද වාණිජ කෘෂිකර්මය යටතේ වගාකරන භෝග දෙකක් ද දක්වන්න.

(2) ඔබ ඉහත දැක් වූ එක් භෝගයක් තෝරා ගෙන

(a) ඊට බලපාන සාධක (b) එම භෝගය ආශ්‍රිතව පවතින ගැටලු

(c) එම භෝගය ආශ්‍රිතව පවතින ප්‍රවණතා කෙටියෙන් පැහැ 7)




08 ශ්‍රී ලංකාව නිවර්තන කලාපය තුළ පිහිටා ඇති නිසාත්, නිතර කාලගුණ අවපාතවලට ලක්වන බෙංගාල බොක්ක ආශ්‍රයෙන් පිහිටා ඇති නිසාත් නිරන්තරයෙන් ස්වාභාවික ආපදාවලට ලක්වේ.


(1) මෙහි ඇති ශ්‍රී ලංකා සිතියමේ A, B, C ලෙස දක්වාඇති ප්‍රදේශවල බහුලව සිදුවන ස්වාභාවික උපද්‍රව දක්වා එම ප්‍රදේශ නම් කරන්න.

(2) ඉන් එක් ස්වාභාවික උපද්‍රවයක් තෝරා ගෙන එය හඳුනාගත හැකි ආකාරය කෙටියෙන් දක්වන්න.

(3) ස්වාභාවික ආපදා කළමනාකරණය සඳහා ගතයුතු පියවර එක් ස්වාභාවික උපද්‍රවයක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

09 ජනාවාස ඇති වූ ආකාරය, විශාලත්වය, බිම් සැලැස්ම හා කාර්යයන් යන කරුණු අනුව ශ්‍රී ලංකාවේ ජනාවාසවල විවිධත්වයක් පවතී.

(1) ශ්‍රී ලංකාවේ පවතින පහත දැක්වෙන ජනාවාස රටා හඳුනාගෙන නම් කරන්න.




A B C

(2) ශ්‍රී ලංකාවේ නගරාශ්‍රිතව කර්මාන්තපුර ඇති කිරීමට හේතු කෙටියෙන් පහදන්න.

**11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව**


(01) (ආ) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම

උ



(01) (ඇ) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම

උ



The National e-learning Portal for The General Education